කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය - පළමු වසර

සෙමෙස්තර අවසාන පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2022/2023

**DMG 1101 - ප්‍රජාවිද්‍යාව පිළිබඳ හැඳින්වීම**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.** **කාලය: පැය දෙකයි (02)**

**මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.**

---

1. අ.) ප්‍රජාවිද්‍යාවේ ආරම්භය සහ ඓතිහාසික විකාශනය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ.) ප්‍රජාවිද්‍යා මූලිකාංග විස්තර කර රටක ජනගහනය අධ්‍යයනය සඳහා ඒවා භාවිතා කළ හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

2. අ.) ජනගහන විශ්ලේෂණ සඳහා පහත සඳහන් මූලාශ්‍ර වලින් දත්ත ලබා ගැනීමේ වාසි සහ අවාසි පැහැදිලි කරන්න.
   i. ජන සංගණන
   ii. ජීව සංඛ්‍යාති ලේඛන

(ලකුණු 10)

ආ.) ජනගහන පිළිබඳ දත්ත ලබා ගැනීමේදී නියැදි සමීක්ෂණ ක්‍රමය යොදා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

3. අ.) සඵලතාව (Fertility) සහ විඵලතාව (Infertility) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ.) සඵලතාව පිළිබඳ ඕනෑම මිනුම් තුනක් (03) උදාහරණයට ගනිමින් ශ්‍රී ලංකාවේ සඵලතා රටා සහ ප්‍රවණතා පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 15)

4. අ.) ළදරු මර්තයතාව (Infant Mortality) සහ ළමා මර්තයතාව (Child Mortality) අතර වෙනස උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ.) "රටක පහළ ළමා මර්තයතාව සහ ඉහළ ජීවිත අපේක්ෂාව එම රටෙහි සමාජ-ආර්ථික සහ ප්‍රජාවිද්‍යාත්මක තත්ත්වයන් පිළිඹිබු කරයි." විමසන්න.

(ලකුණු 15)

5. පහත සඳහන් සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

අ.) නවසූත මරණ අනුපාතිකය සහ පශ්චාත් නවසූත මරණ අනුපාතිකය (Neo-Natal Mortality Rate and Post Neo-Natal Mortality Rate)

ආ.) මුළු සඵලතා අනුපාතිකය සහ අදේශක සඵලතා මට්ටම (Total Fertility Rate and Replacement Fertility Level)

ඇ.) අභ්‍යන්තර සංක්‍රමණය සහ ජාත්‍යන්තර සංක්‍රමණය (Internal Migration and International Migration)

ඈ.) ආර්තවාරම්භය සහ ආර්තවහරණය (Menarche and Menopause)

ඉ.) වයස් සංයුතිය සහ පුම්තිරි සංයුතිය (Age Composition and Sex Composition)

(04x5 = ලකුණු 20)